# ශ්‍රී ලංකා (*Elephas Maximus Maximus*) අලි ඇතුන්ගේ අතීත සහ වර්තමාන ජෛව භූගෝල ව්‍යාප්තිය

චාමර උදයංග *

## අතීත භූගොලීය ව්‍යාප්තිය

*Elephas Maximus Maximus* ගේ පූර්වජයා ලෙස සැලකෙන *Elephas Maximus Sinhaleyus* ගේ හමු වී ඇති ෆොසිල සාධක අනුවද, විශාල දේහ ප්‍රමාණයට සරිලන ජල අවශ්‍යතාවය සහ උෂ්නාධික සත්ත්වයකු වන බැවින් ශරීරයේ පවතින අධික උෂ්නත්වය අඩු කරගැනීමට ජලය අත්‍යාවශ්‍ය සාධකයක් වන බැවින් ද පරිණාමිකවම මෙම අලියා අර්ධ ජලීය ජීවන රටාවකට හුරු වී ඇති බැවින්ද *Elephas Maximus Maximus* ගේ පූර්වජා මෙන්ම මෙම අලි ඇතුන්ද අතීතයේ දී බහුල වශයෙන්ම ඔවුන්ට ඉතාම සුදුසු පරිසර තත්ත්වයන් පවතින ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ රක්වාන කඳු, මධ්‍යම කඳු සහ නකල්ස් කඳු ඇතුළත්ව තෙත් කලාපය පුරා විහිදුන විවිධ පරිසර පද්ධති තුළ පිහිටි පහතරට නිවර්තන වැසි වනාන්තර, උප කඳුකර සදාහරිත වනාන්තර, කඳුකර සදාහරිත වනාන්තර, තෙත් පතනශීල වනාන්තර, තෘණ භූමි, වගුරු බිම් මෙන්ම ඔවුන්ගේ ආහාර, ජලය, ඛණිජ සහ ලවණ අවශ්‍යතාවයන් සපුරාගැනීම සඳහා  අතරමැදි කලාපයේ, වියළි කලාපයේ සහ අර්ධ ශුෂ්ක කලාපවල පිහිටි අර්ධ නිවර්තන සදාහරිත වන්නාත්ර, වියළි කලාපීය වනාන්තර, වියළි පතනශීල වනාන්තර, විල්ලු, කටු පඳුරු සහිත වනාන්තරවල ශ්‍රී ලංකාව පුරාම රංචු වශයෙන් ව්‍යාප්තව සිට ඇත. දැඩි වියළි කාලය පැමිණීමත් සමඟ උෂ්ණත්වය ,ජලය හිඟවීම සහ ආහාර අවශ්‍යතා නිසා ඇතිවන තත්ත්වයන් මත වියළි කලාපයේ ව්‍යාප්තව සිටි අලි ඇතුන් හට නැවත වියළි කලාපයේ සිට තෙත් කලාපයේ වනාන්තර සහ කඳුකර ප්‍රදේශ කරා ගමන් කිරීමට සිදු වීය. මෙම එක් එක් ප්‍රදේශ සහ ඔවුන්ගේ වාසභූමි කරා ගමන් කිරීම සඳහා ඔවුන්ගේ පාරම්පරික මාර්ග (Native paths) මෙම අලි ඇතුන් විසින් භාවිතා කලහ. ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශගුණික කලාප තෙත් කලාපය, අතර මැදි කලාපය, වියළි කලාපය සහ අර්ධ ශුෂ්ක යන කලාපවලින් සමන්විත වේ. මෙම දේශගුණික කලාපවලට නිරිතදිග මෝසමෙන් සහ ඊසානදිග මෝසමෙන් මෙන්ම අන්තර් මෝසම් තුළින්ද වැසි ලැබේ. නිරිත දිග මෝසමෙන් වසරේ වැඩි කාලයක් තෙත් කලාපයට වැසි ලැබෙන අතර එහි ඇති වනාන්තරවලින් වැඩි කොටසක් ඝණ වන ආවරණවලින් වැසී පවතී. වසරේ වැඩි කාලයක් නිරිතදිග මෝසම මගින් තෙත් කලාපයට වැසි ලැබීමෙන් අවුරුද්ද පුරාම ජලය සුලබව පැවතීමත්, විශාල වූ දේහය හිරු එළියට නිරාවරණයවීමෙන් ඇතිවන දැඩි උෂ්ණත්වයට ඔරොත්තු දීම සඳහා තෙත් කලාපයේ ඝණ වන ආවරණවලින් සමන්විත වනාන්තර පද්ධති මෙම අලි ඇතුන්ට සුදුසු වාසස්ථානවීමත් මෙම කලාපයේ ඇති විවිධ පරිසර පද්ධති තුළ ඔවුන්ට අවශ්‍ය පමණට ආහාර තිබීමත් ප්‍රධාන වශයෙන්ම මෙම අලි ඇතුන් තෙත් කලාපය පුරාම ව්‍යාප්තව සිටින්නට හේතු වන්නට ඇත. මෙම කලාපයේ මුහුදු මට්ටමේ සිට මීටර් 2500 පමණ උස් ප්‍රදේශ දක්වා අතර ඇති රක්වාන කඳු පන්තිය, මධ්‍යම කඳුකරය සහ නකල්ස් කඳුවල උස් බිම්වල ඇති වනාන්තර තුළද මෙම අලි ඇතුන් ව්‍යාපාත්ව සිටියහ. ප්‍රධාන වශයෙන්ම ඊසාන දිග මෝසමෙන් වැසි ලැබෙන වියළි සහ අතර මැදි කලාපවලට වසරේ මාස තුනක් හෝ හතරක පමණ ඉතා කෙටි කාලයක් තුළ දැඩි වර්ෂාපතනයක් පතිත වන අතර වසරේ අනෙකුත්

කාලයන්වලදී වියළි හෝ ඉතා දැඩි වියළි දේශගුණික තත්ත්වයක් පවතී. මධ්‍යම කඳුකරයෙන් හටගන්නා මහවැලි ගංගාව වියළි කලාපය පෝෂණය කරන ප්‍රධානතම ගංගාව වන අතර වියළි කලාපයේ ඉතා විශාල භූමි ප්‍රමාණයක් පෝෂණය කරමින් දිවයිනේ නැගෙනහිර ප්‍රදේශයෙන් මුහුදට ගලා බසී. කඳුකර ප්‍රදේශවලින් හට ගන්නා මල්වතු ඔය, යාන් ඔය, කලා ඔය, මොදර ගං ආර, අරුවි ආරු, කුඹුක්කන් ඔය, කිරිඳි ඔය, ඊරිගෙ ඔය වැනි ඔයවල් විශාල ප්‍රමාණයකින් සහ තවත් ගංගා ඇළ දොළවලින්ද මෙම කලාපය ජලයෙන් පෝෂණය වේ. වසරේ වැඩි කාලයක් වැසි නොලැබීම සහ වියළි කාලගුණ තත්ත්වයක් පැවතීම හේතුවෙන් මෙම ඔයවල්, ගංගා සහ ඇළදොළ වියළි කාලයන්වලදී සිඳී යන අතර මධ්‍යම කඳු පන්තියේ ඇති මොහොර කලාපවලින් පෝෂණය වන මහවැලි ගංගාවේ පමණක් ජලය යම් පමණකට ඉතිරි වේ. වියළි සහ අන්තර් කලාපයේ පැවති මෙම වියළි දේශගුණික සහ කාලගුණික තත්ත්වයන් අතීතයේදී මෙම අලි ඇතුන් තෙත් කලාපය මූලික කරගනිමින් ව්‍යාප්තවීමට හේතුවන්නට ඇත. ප්‍රාග් ඓතිහාසික යුගයේදී තෙත් කලාපය පුරා ව්‍යාප්තව සිටි මානවයින් පසුකාලීනව අන්තර් සහ වියළි කලාපවලට සංක්‍රමණය වෙමින් ව්‍යාප්ත විය. ප්‍රාග් ඓතිහාසික මානවයින්ගේ ෆොසිල පිළිබඳව සිදුකළ පර්යේෂණවලින් ලැබී ඇති කාල නිර්ණයන්ට අනුව (Carbon dating) මෙය සනාථ වී තිබේ. පසුව මෙම කලාපය තුළ මානවයිනගේ ව්‍යාප්තිය සහ මානව ගහණය වර්ධනයවීමත් සමග වැඩි වූ ආහාර අවශ්‍යතාවය අනුව ඔවුන් ක්‍රමයෙන් දඩයම් යුගයෙන් කෘෂි කාර්මික යුගයකට පැමිණ කෘෂි කාර්මික දිවි පෙවෙතකට අනුවර්තනය විය. කෘෂි කර්මාන්තය සඳහා ඉතාම සුදුසු දේශගුණික පසුබිමක් පවතින වියළි කලාපයේ කෘෂිකර්මය මූලික කරගත් දිවි පැවැත්මක් සඳහා ජලය අත්‍යාවශ්‍ය සාධකයක් වන බැවින්, වර්ෂයේ ඉතා කෙටි කාලයක් තුළදී පමණක් වර්ෂාව ලැබෙන වියළි කලාපයේ ව්‍යාප්ත වූ මෙම මිනිසුන්ටද වියළි කාලයන් හීදී ජලය හිඟකම නිසා ජලය සුලබ ප්‍රදේශ (තෙත් කලාපය) කරා ඇදී යන්ට සිදුවන අලි ඇතුන්ට මෙන්ම තම කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය සපයා ගැනීම ඉතා දුෂ්කර කටයුත්තක් වන්නට ඇත. එම හේතුව නිසාම වසරේ ඉතා කෙටි කාලසීමාවක් තුළ දී තමන්ට ලැබෙන ජලය දිගු කාලයක් පුරා පවතින වියළි කාලයන්වලදී කෘෂි කාර්මික සහ අනෙකුත් අවශ්‍යතාවයන් සඳහා ප්‍රයෝජනයට ගැනීමට එක්රැස්කර තබාගැනීම ඔවුන් හට තිබූ ප්‍රධාන අභියෝගයකි. ශ්‍රී ලංකාවේ වාරි ඉන්ජිනේරු තාක්ෂණය ලොව මවිත කිරීමට තරම් ඉතා දියුණු මට්ටමකට වර්ධනය වීමට, අතීත මිනිසුන් වියළි කාලයන්වලදී විශේෂයෙන්ම කෘෂිකාර්මික කටයුතුවලට සහ වෙනත් ජල අවශ්‍යතාවයන් සපුරාගැනීමට තිබූ දුෂ්කරතාවයන් මගහරවා ගනිමින් එම අභියෝගයන්ට මුහුණදෙමින් ගත් උත්සාහයන් හේතුවන්නට ඇත. මෙසේ වාරි තාක්ෂණය දියුණුවීමත් සමඟ හෙළ වාරි ඉංජිනේරුවරුන් විසින් උස් ස්ථානවලින් මහවැලි ගඟේ අතු ගංගා සහ කඳුකරයෙන් ආරම්භ වී ගලා බසින ඔයවල් හරස් කරමින් අමුණු බැඳ කිලෝමීටර් දහස් ගණන් දිවෙන විශාල ඇළ මාර්ග නිර්මාණය කළහ. මෙම ඇළ මාර්ග තුළින් ගෙන යන ජලය වසරේ වැඩි කාලයක් පුරා පවතින වියළි කාලයේ දී ප්‍රයෝජනයට ගැනීම සඳහා එක් රැස් කර තබා ගැනීමට විශාල, මධ්‍යම සහ කුඩා ප්‍රමාණයේ වැව් දහස් ගණනක් මුළු වියළි කලාපය පුරාම නිර්මාණය කලහ. මිනිසා විසින් නිර්මාණය කළ ද මෙම ඇළ මාර්ග සහ දහස් ගණනක් වූ වැව් විධිමත්ව පරිසරයට වන හානිය ඉතා අවම අගයක පවත්වාගෙන යමින් පරිසර හිතකාමීව සහ උසස් තාක්ෂණික ඥාණය උපයෝගී කරගෙන නිර්මාණය වූ බැවින් පසුව ස්වභාවික පරිසරය සමඟ බද්ධ වී ඒ වටා නොයෙක් පරිසර පද්ධති ගොඩනැගුණි (අලි ඇතුන් සඳහා සුදුසු

ජලජ පරිසර පද්ධති - Aquatic Vagitation). අතීතයේදී මිනිසාගේ ජල අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා නිර්මාණය වුවද, මෙසේ නිර්මාණය වූ ඇළ මාර්ග, දහස් ගණනක් වූ වැව් සහ ඒ වටා ගොඩනැගුණු පරිසර පද්ධතීන් පසු කාලීනව අලි ඇතුන්ගේ ජලය, ආහාර අවශ්‍යතාවයන් සපුරා ගැනීම සහ වියළි කලාපය තුළ ව්‍යාප්තිය සඳහා විශාල දායකත්වයක් ලැබුණි.

**අලි ඇතුන් පිළිබඳ ඓතිහාසික සාක්ෂි සහ ලිඛිත වාර්තා**

මහාවංසයේ සහ වෙනත් ලිඛිත වාර්තාවලද අතීතයේ දී අලි ඇතුන් අල්ලා ගැනීම විකිණීම සහ විවිධ කටයුතු සඳහා භාවිතා කළ ආකාරය පිළිබඳව සඳහන් කොට ඇත.

- ක්‍රිස්තු පූර්ව 2 වන සියවසේ දී දුටුගැමුණු රජතුමා විසින් කණ්ඩුල නම් ඇතා මංගල හස්තියා ලෙස භාවිතා කළ බවත්, යුද්ධය ජයග්‍රහණය කිරීම සඳහා සහ එළාර සමඟ අන්තිම සටනේදී මෙම ඇතා රණකාමී ලෙස දුටුගැමුණු රජුගේ ජයග්‍රහණය සඳහා විශාල දායකත්වයක් ලබා දුන් බවත් කණ්ඩුල ඇතා කුඩා කාලයේ දී වර්තාමානයේ යාල වනෝද්‍යානයට නුදුරු ස්ථානයක තිස්සමහාරාම ප්‍රදේශයේ විල්ලුවක සිටියදී අල්ලා ගත් බවත් යුධ කටයුතු සඳහා අලි ඇතුන් භාවිතා කළ බවත් සඳහන් කොට ඇත.

- පොළොන්නරුවේ ඇති සෙල්ලිපියක සඳහන් වන පරිදි නිශ්ශංක මල්ල රජතුමා විසින් ශෛලමය ආසානයක හිඳ ඇත් පොර නරඹා ඇත.

- නොක්ස් (1681) සඳහන් කරන පරිදි නුවර රජකම් කළ සිංහලයේ රජු උස් වූ ස්ථානයක සාදන ලද අට්ටාලයක සිට ඇත් පොර නරඹා ඇත. මෙම ඇතුන්ගේ වර්ධනය සඳහා දළ අග කොටස කපා දමා තිබූ බවද සඳහන් කර ඇත.

- පෘතුගීසී සහ ලන්දේසී වාර්තාවල සිංහල යුධ භේවායන් අලි ඇතුන් යුධ කටයුතු සඳහා භාවිතා කළ ආකාරයත් එම අලි ඇතුන්ගේ රණකාමීත්වයත් අලි ඇතුන් අල්ලාගැනීම පිළිබඳවත් සඳහන් වේ.

- ඩොයිලි (1833) අලි ඇතුන් අල්ලාගැනීම, අලි ඇතුන් ආරක්ෂා කිරීමට තිබූ නීති, ඇත් පොර සහ රජතුමාගේ රාජකීය ඇත් ගාල පිළිබඳව විස්තර සපයා ඇත.

- ක්‍රිස්තු පූර්ව පළවන සියවසට අයත් නැගෙනහිර පළාතේ පානම් පත්තුවේ පිහිටා ඇති නාවලර් කුලම් සෙල්ලිපියේ සඳහන් වන පරිදි ඇත් ගාලේ ප්‍රධානියා රජතුමා බවත් අලි ඇතුන් බාරව සිටි නිළ තල පිළිබඳවත් අලි ඇතුන් මදු ගසා, ගාල් කර ඇල්ලීම හීලෑ කිරීම සහ යුධ සහ වෙනත් කටයුතු සඳහා පුහුණු කිරීමට කුරුවේ නමින් හඳුන්වන මිනිසුන් පිරිසක් සිටි බවත් අල්ලන ලද සියලුම දළ සහිත සතුන් සහ ගෝමර (white spotted) සහිත සතුන් රාජකීය ඇත් ගාල වෙත යැවූ බවත්, ඉතරු සතුන් අල්ලා ගාල තුළ රඳවා තිබූ බවත් සඳහන් කර ඇත.

- නුවර සෙන්කඩගල රාජධානියේ අලි ඇතුන් මරා දමන ලද මිනිසුන්ට කස පහර දෙමින් වීදි දිගේ ගමන් කරවා දඬුවම් දී ඇත. දළ ඇතෙකු මරා දමනු ලැබුව හොත් දඬුවම වැඩි වූ අතර අලියකු මරා දමුව හොත් අඩු දඬුවම් ලබා දී ඇත.

- ක්‍රිස්තු පූර්ව 3 වන සියවසේදී මහා ඇලෙක්සැන්ඩර් රජුගේ නිලධාරයෙකු වන ඔනෙසෙක්‍රිටස් Onesicritus ශ්‍රී ලංකාවේ අලි ඇතුන් යුධ කටයුතු සඳහා යොදාගත් බවත් ශ්‍රී ලංකාවේ අලි ඇතුන් ඉන්දියාවේ ඇතුන්ට වඩා ප්‍රමාණයෙන් විශාල සහ රණකාමී බව සඳහන් කර ඇත.

- මෙගස්තනීස් Megasthanes (Circa 300 B.C) විසින් ද ශ්‍රී ලංකාවේ අලි ඇතුන් ප්‍රමාණයෙන් විශාල සහ යුධ කටයුතු සඳහා වඩා යෝග්‍ය බව සඳහන් කර ඇත.

- ක්‍රිස්තු පූර්ව 200 දී ශ්‍රී ලංකාවේ සිට කාලිංග දේශයට (දකුණු ඉන්දියාවට) විශේෂ බෝට්ටු මගින් ශ්‍රී ලංකාවේ අලි ඇතුන් ප්‍රවාහනය කළ බව ඇලියන් Aelian (44 A.C) සඳහන් කර ඇත.

- ක්‍රිස්තු වර්ෂ 175 දී ටොලමි විසින් සාදන ලද ලංකා සිතියමෙහි රුහුණු දිස්ත්‍රික්කයේ ව්‍යාප්තව සිටි අලි ඇතුන්ගේ තෘණ භූමි (Feeding grounds) සටහන් කර ඇත. එමෙන්ම ශ්‍රී ලංකාවේ අලි ඇතුන් වෙනත් රටවලට ප්‍රවාහනය කරන ප්‍රධානතම තොටුපොළ මන්නාරම බව සඳහන් කර ඇත.

- හය වන සතවර්ෂයේ දී ශ්‍රී ලංකාවේ අලි ඇතුන් යුධ කටයුතු සඳහා ඉතාම උසස් අලි ඇතුන් ලෙස ඉන්දියාවේ ප්‍රසිද්ධියට පත් වී ඇත. (Cosmos)

- ක්‍රිස්තු වර්ෂ 1506 දී පෘතුගාලයේ මැනොඑල් රජු විසින් ඉන්දියාවේ සිටි රජුගේ නියෝජිතයා වන දොන් ෆ්‍රැන්සිස්කෝ ඩි අල්මේදාට ශ්‍රී ලංකාවේ අලි ඇතුන් සහ කුරුඳු ප්‍රවාහනය සඳහා වරායක් සාදන ලෙස අණ කර ඇත.

- පළවන රාජසිංහ රජු විසින් අලි ඇතුන් 2200 ක පමණ සේනාවක් යොදවා 1587- 1588 අතර කාලයේදී කොළඹ පිහිටි පෘතුගීසි බලකොටුව වටකොට පහර දී ඇත. (Pieris 1913)

1666 සිට 1871 දක්වා අතර කාලයේ දී පෘතුගීසි සහ ඉංග්‍රීසි ජාතිකයින් විසින් ගාල් ක්‍රමය (Kraal) මගින් වෙනත් රටවලට විකිණීමට සහ නොයෙක් කාර්යන් සඳහා හීලෑ කිරීමට ශ්‍රී ලංකාවේ අලි ඇතුන් අල්ලා ගැනීම පිළිබඳව ඇති වාර්තා.

**පෘතුගීසි වාර්තා**

1666 දී එක් ගාලකින් අලි ඇතුන් 96 අල්ලාගෙන ඇත (Pieris 1918)

1681 දී ගාල් තුනකින් පිළවෙලින් 13ක්, 104 ක් සහ 240 අල්ලාගෙන ඇත (La' Combe 1681)

1690 දී 160 ක් අල්ලා ගෙන ඇත. එයින් 20 න් එකෙකු දළ දරා ඇත (Strachan 1690)

1967 දී මාතර කොටුව ප්‍රදේශයේ දී අලි 97 කු ගාල් කර අල්ලාගෙන ඇති අතර එයින් 7 කු දළ සහිත ඇතුන්ය (Perera 1949)

**ඉංග්‍රීසි වාර්තා**

1797 දී එක් ගාලකින් අලි ඇතුන් 176 ත් අනෙක් ගාලෙන් 400 ත් අල්ලා ගෙන ඇත (Percival 1803)

1805 දී තංගල්ලට නුදුරු කොටව නම් ප්‍රදේශයේ දී අලි ඇතුන් 300 ගාල් කර අල්ලාගෙන ඇත (Cordiner,p.213)

1805 දී කොටව ප්‍රදේශයෙන් අලි ඇතුන් 70 අල්ලාගෙන ඇති අතර ඉන් 4 කු දළ ඇතුන්ය. (Cordiner)

1849 දී කොළඹට නුදුරු ස්ථානයක දී අලින් 6 කු අල්ලාගෙන ඇති අතර දෙදෙනෙකු වෙඩි තබා මරා දමා ඇත (Wild Ceylon)

1871 දී අලින් 28 කු සහ එක් ඇතෙක් අල්ලාගෙන ඇත (Cappper 1871)

1870 දී එංගලන්තයේ ඇල්ෆ්‍රඩ් කුමාරයා සහ 1882 දී වේලිසයේ ජෝර්ජ් කුමාරයා ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථා දෙකේදී ඔවුන්ට නැරඹීම සඳහා බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ මායිම්ව පිහිටි මීපේ සිට ඉංගිරිය කොළඹ මාර්ගයේ ඉහළ බෝපේ සිට ටික දුරක් ගිය තැන හමුවන ලබුගම (Capper 1871) ජලාශයට ආසන්න වැවිල නම් ප්‍රදේශයේත් සබරගමුව මායිම්ව නිරිඇල්ල ප්‍රදේශයේත් අලි ගාල් (Kraal) පවත්වා ඇත. අලි ගාල තැනීම සඳහා සිටුවන ලද විශාල ප්‍රමාණයේ ගස් කඳන්වල ඉතිරි වූ කොටස් කිහිපයක් වර්තමානයේදී පවා වැවිල ප්‍රදේශයේ දක්නට ලැබේ.

වේයන්ගොඩ සහ මීගමුව අවට ප්‍රදේශවලදී අලි ගාල් පැවැත්වූ බවට වාර්තා ඇත ( Doyly 1815 ; Pieris 1938)

මීට අමතරව මාතර, ගාල්ල, කොග්ගල, කොට්ටව ,තංගල්ල, හම්බන්තොට, හිනිදුම, දිවිතුරෙ, ඇත්කඳුර, ඇල්පිටිය, මීගමුව, ගම්පහ, වේයන්ගොඩ, කටුවන, වලස්මුල්ල, කඹුරුපිටිය නාරන්දෙනිය, නිරිඇල්ල, ලබුගම වැවිල, කලවාන, බුලත්සිංහල නාහල, එබවලපිටිය, පළුගොල්ල, අඹන්පොළ, දඹදෙනියේ ඇටම්පොල, මාවතගම, ලේපොළොව, ගල්ගමුව, ආනමඩුව, කරුවලගස්වැව, වෑ උඩ සහ මූලකන් යාය වැනි ප්‍රදේශවල සහ දිවයිනේ වෙනත් ප්‍රදේශවලද අලි ඇතුන් ඇල්ලීම සඳහා අලි ගාල් (Kraal) පවත්වා ඇති බවට ඓතිහාසික සහ ලිඛිත සාක්ෂි ඇත. ජෝන් විල්සන් මඩුවන්වල දිසාවේ විසින් ආරම්භ කරන ලදුව පසුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායකවරයෙකුව සිටි සර් ප්‍රැන්සිස් මොලමුරේ මහතාට (1950) අයත්ව තිබූ ඇඹිලිපිටිය සූරියකන්ද මාර්ගයේ කොලොන්න ප්‍රදේශයේ පනාමුරේ අලි ගාල අලි ඇතුන් අල්ලා ගැනීම සඳහා

තිබූ ශ්‍රී ලංකාවේ අවසන් අලි ගාලයි. 1950 වලදී එම ඇත් ගාලට කොටු වූ අලි රංචුව අතර සිටි කලහ කාරීව හැසිරුනු වැඩිමල් පිරිමි සතෙකු (Dominant Male) වෙඩි තබා ඝාතනය කිරීම නිසා ඇති වූ ජනතා විරෝධය තුළ එවකට පැවති රජය විසින් මෙම අලි ගාල නවතා දමන ලදී. ඉන් පසුකාලීනව 1970- 1980 දශකවල අවස්ථා කිහිපයකදී වනජීවී දෙපාර්තමේන්තුව විසින් දිවයිනේ විවිධ පළාත්වල ඉතිරිව තිබූ කුඩා කැලෑ ප්‍රදේශවල කොටු වී සිටි සහ ගම් වදින අලින් (උදාඃ- දූදුරු ඔය නිම්නය) අල්ලා වෙන්දේසි කර ඇත. වර්තමානයේ දී වනජීවී ආඥා පනත ප්‍රකාරව කිසියම් විශේෂ හේතුවක් මත වෙනත් ප්‍රදේශයකට මුදා හැරීම සඳහා හැර අලි ඇතුන් ඇල්ලීම, අල්ලා හීලෑ කිරීම විකිණීම හෝ වෙනත් කිසිම කටයුත්තක් සඳහා භාවිතා කිරීම සපුරා තහනම් වන අතර දැඩි තර්ජිත සත්ත්වයකු ලෙස නම් කර සංරක්ෂණ ක්‍රියාමාර්ග ගෙන ඇත.

ඓතිහාසික සාක්ෂි සහ ලිඛිත වාර්තාවලට අනුව අතීත රාජ්‍ය පාලනයන් පැවති සමයන්වලදී සහ ලන්දේසි, පෘතුගීසි, ඉංග්‍රීසි යටත්විජිත කාලවලදී අලි ඇතුන් අල්ලා හීලෑකොට රාජකීය ඇත් ගාල්වලට, යුධ කටයුතු, බර වැඩ ගැනීම, කෘෂි කාර්මික කටයුතු, සංස්කෘතික උත්සව සඳහා යොදාගැනීමට සහ මෙරට මෙන්ම වෙනත් රටවලට විකිණීම සඳහා මදූ ගැසීම (Noosing), මත් බෙහෙත් උපායශීලීව අලියාද දීමෙන් (Doping) සහ විශාල භූමි ප්‍රමාණයක් කොටු කර ආවරණය වන පරිදි ඉතා ශක්තිමත් ලී කොට භාවිතා කරමින් සාදන ලද ගාල් ක්‍රමය (Kraaling) භාවිතා කරමින් ද විශාල වශයෙන් අල්ලාගෙන ඇති අතර, විශේෂයෙන්ම ඉංග්‍රීසි යටත් විජිත කාලයේදී සිටි ඇතැම් ඉංග්‍රිසි ආණ්ඩුකාරවරුන්, දිසාපතිවැරන්, ප්‍රභුවරුන් සහ වැවිලිකරුවන් විසින් දළ ලබා ගැනීම සඳහා සහ විනෝදාංශයක් ලෙස ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල අලි ඇතුන් විශාල ප්‍රමාණයක් ඝාතනය කොට ඇත. බදුල්ලේ දිසා විනිසුරුවරයාව සිටි මේජර් තෝමස් විලියම් රොජර්ස් පමණක් නුවර එළිය, මහ එළිය තැන්න (හෝර්ටන් තැන්න) සහ ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල අලි ඇතුන් 1300 - 1400 පමණ මරා දමා ඇත. සර් සැමුවෙල් බ්‍රේකර්ස් විසින් ද හෝර්ටන් තැන්න සහ අවට ප්‍රදේශවල සිටි අලි ඇතුන් 400 කට වැඩි ප්‍රමාණයක් මරා දමා ඇත. බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේදී තේ සහ රබර් වගාවන් සඳහා තෙත් කලාපයේ කඳුකර මෙන්ම පහත් බිම්වල තිබූ වනාන්තර විනාශය ආරම්භ කිරීමත් සමගම එම වනාන්තරවල දිවි ගෙවූ අලි ඇතුන් දහස් ගණනක් ඉංග්‍රීසි ජාතිකයින් විසින් විනෝදය පිණිස දඩයම් කළ බව එම දඩයම් කරුවන්ගේ දිනපොත් සටහන්වලින් හෙළි වේ. ඉහත සඳහන් කරන ලද කරුණු, ඓතිහාසික සාක්ෂි සහ ලිඛිත වාර්තා සලකා බැලීමේදී සංඛ්‍යාත්මක වශයෙන් සඳහන් කළ නොහැකි වුවද අතීතයේදී අලි ඇතුන් ශ්‍රී ලංකාවේ කිනම් ප්‍රදේශවල පැතිර සිටියේද ඔවුන්ගේ භූගෝලීය ව්‍යාප්තිය සහ එම අලි ඇතුන් ව්‍යාප්තව සිටි ප්‍රදේශවල කොපමණ අලි ඇතුන් ගහණයක් සිටින්නට ඇත්ද යන්න යම්කිසි නිගමනයකට එළඹිය හැකිය. සබරගමු පළාත තුළ පිහිටි සීතාවක රාජධානියේ රජ කළ පළමුවන රාජසිංහ රජු සමයේ (ක්‍රි.ව. 1580-1592) කොළඹ පිහිටි පෘතුගීසි බලකොටුවට පහර දීමට අලි ඇතුන් 2200 ක පමණ සමන්විත අලි ඇතුන් හමුදාවක් වනයෙන් අල්ලා හීලෑ කොට යුධ කටයුතු සඳහා යොදා ගැනීමට නම් ඊට සාපේක්ෂව සැළකිය යුතු අලි ගහණයක් ශ්‍රී ලංකාවේ වනාන්තරවල සිටිය යුතුය. 2200 පමණ වූ අලි ඇතුන් හමුදාවක් සපයා ගැනීමට තෙත් කලාපයේ මෙන්ම අන්තර් සහ වියළි කලාපවල සිටි අලි ඇතුන්ද එම ප්‍රදේශවලට ගොස් අල්ලා ගන්නට ඇත. සබරගමු පළාත තෙත් කලාපය තුළ පිහිටා තිබීමෙන් එම කාල වකවානුව වන විට තෙත් කලාපයේ ද විශාල අලි ඇතුන්

ගහණයක් ව්‍යාප්තව සිටි බව සිතිය හැකිය. ඉංග්‍රීසි ජාතික දඩයම් කරුවන් වන මේජර් තෝමස් විලියම් රොජර්ස් සහ සර් සැමුවෙල් බ්‍රේකර්ස් විසින් පමණක් පිළිවෙලින් අලි ඇතුන් 1300 සහ 400 වැඩි ප්‍රමාණයක් හුදෙක් විනෝදාංශයක් පිණිස ඝාතනය කිරීමට නම් බදුල්ල, හපුතලේ, නුවර එළිය, හෝර්ටන් තැන්න සහ ඒ අවට ප්‍රදේශවල සැළකිය යුතු අලි ඇතුන් ගහණයක් ව්‍යාප්තව සිටිය යුතුය. විශේෂයෙන්ම ගාල් ක්‍රමය මගින් (elephant kraal) අලි ඇතුන් අල්ලා හීලෑ කර නොයෙක් කටයුතු සඳහා යොදාගැනීමට සහ විකිණීම සඳහා අල්ලා ගැනීමට පිහිටුවා තිබූ අලි ගාල් ඉංග්‍රීසි පාලන සමයේදී තෙත් කලාපය මෙන්ම අනෙකුත් කලාපවලද පිහිටා තිබීමෙන් ක්‍රි.ව. 1800 ගණන් පමණ කාලය වන විටත් තෙත් කලාපය සහ ශ්‍රී ලංකාවේ අනෙකුත් කලාපවලද අලි ඇතුන් ව්‍යාප්තව සිටි බවට සාක්ෂි සපයයි.

**වර්තමාන භූගෝලීය ව්‍යාප්තිය**

මීට සියවස් 2.5 පමණ පෙරදී අලි ඇතුන්ට ජීවත්වීමට ඉතාම සුදුසු පරිසර තත්ත්වයන් පැවති බස්නාහිරින් අත්තනගලු ඔයටත් දකුණින් නිල්වලා ගඟටත් මායිම්ව, සබරගමු පළාත, බස්නාහිර පළාත, මධ්‍යම පළාත සහ දකුණු පළාතේ තෙත් කලාපයට අයත් වන ප්‍රදේශවල අලි ඇතුන් ව්‍යාප්තව පැවතියද අද වන විට එම තත්ත්වය මුළුමනින්ම පාහේ වෙනස් වී ඇත. සියවස් 2.5 පෙරදී බස්නාහිර පළාතේ ඇතැම් ප්‍රදේශවල පවා අලි ඇතුන් සුළු වශයෙන් හෝ දැක ගැනීමට හැකිවීම සාමාන්‍ය දෙයක් විය. 1730 දී සකස් කරන ලද කොළඹ නගරයේ සිතියමක වර්තමානයේ දී Ridgeway Golf Link නැමති ස්ථානයේ අලි ගාලක් පැවති බවට සඳහන් කර ඇත. තවද Doyly 1815 සහ Peries 1938 දී වේයන්ගොඩ සහ මීගමුවේ අලි ගාල් පැවති බවට වාර්තාවල සඳහන් කර ඇත. 1871 Capper විසින් කොළඹ දිස්ත්‍රික්කයට මායිම්ව ඇති ලබුගම අලි ගාලක් පැවති බවට වාර්තා කර ඇත. අතීතයේ දී එසේ පැවතියද වර්තමානය වන විට ජලයට ඉතා ප්‍රිය කරන මෙම අලි ඇතුන් තෙත් කලාපයෙන් සම්පූර්ණයෙන්ම පාහේ නැතිවී ගොස් ඔවුන්ට ජීවත් වීමට ඉතාම සුදුසු පරිසර තත්ත්වයන් නොපවතින අතර මැදි කලාපයේ සහ වියළි කලාපයේ උතුරු මැද, වයඹ, ඌව, නැගෙනහිර, උතුරු සහ දකුණු පළාත්වලට අයත් ඉතිරි වී ඇති වනාන්තරවල අභය භූමි, ජාතික වනෝද්‍යාන, වන රක්ෂිත, ස්වභාව රක්ෂිත, දැඩි රක්ෂිත, වනෝද්‍යාන මායිම් සහ ඉන් පිටත ඇති ප්‍රදේශවලට සීමා වී ව්‍යාප්ත වී ඇත. වියළි සහ අන්තර් කලාප ව්‍යාප්තව ඇති අලින්ගේ වාසභූමිවලින් 65% පමණ පිහිටා ඇත්තේ රක්ෂිත ප්‍රදේශවලින් පිටත වේ. ජාතික වනෝද්‍යාන, අභය භූමි, වන රක්ෂිත, සහ රක්ෂිත පෙදෙස්වලට අමතරව අලි ඇතුන් හට ජීවත්වීමට කිසි සේත් ප්‍රමාණවත් නොවන ඉන් පිටත ඉතිරිව ඇති ඉතා කුඩා කැලෑ පෙදෙස්වල ද අලි ඇතුන් දිවි ගෙවති. තෙත් කලාපයෙන් බැහැරව පැවතිය ද අලි ඇතුන් මෙම පරිසර පද්ධතිවලට ඉතා හොඳින් අනුවර්තනයවීමක් පෙන්නුම් කරයි. උතුරු සහ නැගෙනහිර පළාත්වලද අලි ඇතුන් ව්‍යාප්තව ඇතත් දශක තුනක් පමණ පැවති යුධමය වාතාවරණය නිසා උතුරු හා නැගෙනහිර පළාත්වල යුධමය තත්ත්වයන් පැවති ප්‍රදේශවල ඇති වනාන්තරවල ව්‍යාප්තව ඇති අලි ඇතුන්ගේ වර්තමාන ව්‍යාප්ති රටාවන් පිළිබඳව සහ සංඛ්‍යාත්මක තොතරතුරු අල්පය. දශක තුනක් පුරා පැවති යුධමය තත්ත්වය නිමා වී ඇති නමුත් එම ප්‍රදේශවල ව්‍යාප්ත වී සිටින අලි ඇතුන් පිළිබඳව තවමත් නිසි අධ්‍යයනයක් සිදුකර නොමැත. ඉදිරියේ දී උතුරු සහ නැගෙනහිර පළාත්වල ව්‍යාප්තව

සිටින අලි ඇතුන්ගේ ව්‍යාප්ති රටාවන් පිළිබඳව දැන ගැනීම සඳහා පර්යේෂණ සහ අධ්‍යයනයන් සිදු කළ යුතුව ඇත.

1505 සිට 1948 දක්වා පැවති පෘතුගීසි, ලන්දේසි සහ බ්‍රිතාන්‍ය යටත් විජිත කාලයේදී අලි ඇතුන් හීලෑ කිරීම විකිණීම සඳහා විශාල ප්‍රමාණයක් ගාල් කර අල්ලා ගත් අතර තෙත් කලාපයේ රක්වාන, මධ්‍යම සහ නකල්ස් කඳු පන්තිවලට අයත් කඳුකර, උප කඳුකර සහ පහත රට නිවර්තන වැසි වනාන්තර තේ, රබර්, කෝපි සහ එනසාල් වැනි වගාවන් ආරම්භ කිරීම සඳහා විශාල වශයෙන් කපා දැමුණි. එම වනාන්තරවල ජීවත් වූ අලි ඇතුන් සිය දහස් ගණනින් බ්‍රිතාන්‍ය ජාතික දඩයක්කරුවන් විසින් දළ ලබාගැනීමට සහ විනෝදය පිණිස මරා දමන ලදී. 1829 සිට 1855 දක්වා අතර කාලයේදී පමණක් අලි ඇතුන් 6000 ක් පමණ ප්‍රමාණයක් අල්ලාගෙන සහ මරා දමා ඇත. වනාන්තර විනාශයත් සමඟ සිදු වූ වාසස්ථාන අහිමිවීමත් එම වනාන්තර තුළ ජීවත් වූ අලි ඇතුන් විශාල වශයෙන් ඝාතනයට ලක්වීමත් ඉතිරි වූ වනාන්තර අලි ඇතුන්ට ජීවත්වීමට ප්‍රමාණවත් නොවන පරිදි කුඩාවීමත් වනාන්තර හුදකලාවීමත් ඔවුන්ගේ පාරම්පරික ගමන් මාර්ග අහිමිවීමත් තෙත් කලාපය තුළ මානව ව්‍යාප්තියත් නිසා අලි ඇතුන් හට අන්තර් සහ වියළි කලාපවල තිබූ වනාන්තර තුළට සීමා වන්නට විය (වර්තමානයේ දී ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් 67% තෙත් කලාපයේ ඉතාම සංවේදී පරිසර පද්ධති තුළ වාසස්ථාන ගොඩනගා ගෙන ව්‍යාප්තව ඇත). ඉංග්‍රීසි පාලන සමයේදී මේ තරම් විශාල වනාන්තර විනාශයක් සිදු වුවද 1930- 1940 අතර කාලයේදී පවා පහත රට තෙත් කලාපයේ යම් කිසි අලි ගහණයක් ඉතිරි වී ව්‍යාප්ත වී සිටියහ. 1930 - 1940 අතර කාලයේ දී දැනට ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම පහතරට වැසි වනාන්තරය (යෝජිත) ලෙස සැලකෙන සිංහරාජ වනාන්තරයට ආසන්නව බස්නාහිර සබරගමුව සහ දකුණු පළාත්වලට මායිම්ව පිහිටා ඇති රූණකන්ද වනාන්තරයේ බස්නාහිර පළාතේ කලුතර දිස්ත්‍රික්කයට අයත් බදුරලිය හැඩිගල්ල දික්හේණ ප්‍රදේශයේ දී අලි ඇතුන් 30 ත් 40 ත් අතර ප්‍රමාණයක් එම ප්‍රදේශයේ දිවි ගෙවූ හපුආච්චිගේ මාර්ටින් නැමැත්තෙකු විසින් නිරීක්ෂණය කොට ඇත. ඔහුගේ සොහොයුරා වන හපුආච්චිගෙ බේබිසිංඤෝ විසින් 1939- 1945 අතර කාලයේදී අලි ඇතුන් 12 ක පමණ රංචුවක් නිරීක්ෂණය කොට ඇත. මෙම අලි රංචුව සිංහරාජය සහ ඒ අවට තිබූ වනාන්තරවල ජීවත් වූ අවසාන අලි රංචුව විය හැකිය. මෙම වනාන්තරවල ඉතිරි වී සිටි අලි ඇතුන්ගේ අවසානය 1970 ගණන්වල එවකට පැවති රජය විසින් කැනේඩියානු සමාගමක් සමඟ එක්ව වර්තමානයේදී සාලාව යුධ හමුදා කඳවුර පිහිටි ස්ථානයේ තුනී ලෑලි සංස්ථාව පිහිටුවා දැව නිපදවීම සඳහා පහත රට තෙත් කලාපයේ ඉතිරිව තිබූ ප්‍රාථමික ගණයේ වනාන්තර කපා දැව යොදා ගැනීමත් සමඟ ආරම්භ විය. එහි ප්‍රතිඵලයක් ලෙස සිංහරාජය, රූණකණ්ද, දෙල්ලව, කලුගල, යගිරල, නාකියාදෙණිය, කොට්ටව, උඩුගම, කන්නෙලිය වැනි වනාන්තර විශාල වශයෙන් කපා දමන ලදී එම වනාන්තරවල ඉතිරි වී සිටි අලි ඇතුන් වනාන්තර විනාශයත් සමඟ ඇතිවන ආහාර හිඟකම නිසා ආහාර සොයා ගම් වැදීමත් සමඟ මිනිසුන් අතින් ඝාතනයට ලක්විය. රූණකන්දේ සිටි අවසන් අලියා 1970 ගණන්වල අග භාගයේදී සහ කන්නෙලියේ විසූ අවසන් අලියා 1998 වර්ෂයේදී ඝාතනයට ලක් විය.

පහත රට තෙත් කලාපයෙන් අලි ඇතුන් සම්පූර්ණයෙන්ම පාහේ නැති වී ගොස් ඇති අතර සබරගමු පළාතේ සහ දකුණු පළාත මායිම්ව පිහිටා ඇති හෙක්ටයාර් දස දහසක් පමණ වන

සිංහරාජ වනාන්තරයේ රක්වාන කඳුපන්තියේ බටහිර බෑවුම් ප්‍රදේශයට වන්නට සූරියකන්ද මෝර්නිං සයිඩ් (Morning Side) ප්‍රදේශයේ පමණක් සිංහරාජයේ දිවි ගෙවන අවසන් අලි තිදෙනා දිවි ගෙවති. මෙම අලින් තිදෙනාම පිරිමි සතුන් වන බැවින් සිංහරාජයේ අලි පරපුර මෙම අලි තිදෙනාගේ අවසානයත් සමඟම අවසන් වනු ඇත. වසරේ ඇතැම් කාලවලදී ඔවුන්ගේ පාරම්පරික ගමන් මාර්ගවල පැමිණෙන මෙම අලි තිදෙනා දෙනියාය, ලංකාගම, දෙල්ලව රක්ෂිත වනාන්තර, පොතුපිටිය, රඹුක, කුඩව, මන්නවත්ත වැනි ප්‍රදේශවලට පැමිණෙන බවට නිරීක්ෂණය කොට ඇත. මෙම අලි තිදෙනා ශ්‍රී ලංකාවේ පහතරට නිවර්තන වැසි වනාන්තරවල ජීවත් වන අවසන් අලි තිදෙනා වේ.

තෙත් කලාපයේ මධ්‍ය කඳුකරයේ ශ්‍රී පාද අභය භූමිය තුළද කුඩා අලි රංචුවක් ව්‍යාප්තව සිටින අතර සංඛ්‍යාත්මක වශයෙන් අලින් කොපමණ ප්‍රමාණයක් මෙම රංචුව තුළ සිටීද යන්න වාර්තා නොමැත. නමුත් ඔවුන් ගමන් ගත් මාර්ගවල සහ ආහාර ගත් ස්ථාන, එම ස්ථානවල තිබූ අඩි සළකුණු, අලි බෙටි නිරීක්ෂණය කිරීමෙන් 20- 25 අතර අලි ප්‍රමාණයකින් මෙම රංචුව සමන්විත වන බවට අනුමාන කර ඇත. ඇතැම් අවස්ථාවල මෙම රංචුවේ සිටින අලීන් නිරීක්ෂණය කිරීමේ අවස්ථාව අවාරේ ශ්‍රීපාද වන්දනාවේ ගිය වන්දනාකරුවන්ට සහ ශ්‍රීපාද අඩවි වන ජීවී නිලධාරීන්ට ලැබී ඇත. වසරේ ඇතැම් කාලවලදී ශ්‍රීපාද අභය භූමියේ සබරගමුව පළාතට අයත් රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට මාර්ගය එරත්න සහ පළාබද්දල ප්‍රදේශයෙත් කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් දූරණියගල උඩ මාලිබොඩ ප්‍රදේශයෙත් මධ්‍යම පළාතේ නුවර එළිය දිස්ත්‍රික්කයට අයත් හැටන් නල්ලතන්නිය මාර්ගයේ හැමිල්ටන් වත්ත ප්‍රදේශයෙදීත් සඳගලතැන්න, ධර්මරාජගල වැනි ස්ථානවලත් මෙම අලි රංචුව නිරීක්ෂණය කොට ඇත. මීට අවුරුදු කිහිපයකට පෙර හැමිල්ටන් වත්ත ප්‍රදේශයේදී ස්වභාවිකව මියගිය අලියකුගේ මළ සිරුරක් සොයාගන්නා ලදී. වර්තමානයේදී මෙම අලි රංචුව ශ්‍රීපාද අභය භූමියට පමණක් සීමා වී ජීවත්වන බවට මත ඉදිරිපත් වුවද වෙනත් ප්‍රදේශ කරා ඇදී යනවාද යන්න සොයා බැලීම සඳහා කිසිදු අධ්‍යයනයක් මෙතෙක් සිදුකර නොමැත. අතීතයේ දී ශ්‍රීපාදයේ ව්‍යාප්තව සිටි අලි රංචු කිරිබත්ගල බඹරබොටුව හරහා සිංරාජය සහ රක්වාන කඳු වෙතත් එතැනින් වලන්කන්ද දෙල්ලව රක්ෂිත හරහා කන්නෙලිය වනාන්තරය දක්වාත්, බලන්ගොඩ සමනල වැව ප්‍රදේශය හරහා ඌව පළාතට අයත් උඩවලව, තණමල්විල ප්‍රදේශය දක්වාත්, දකුණු පළාතේ බුන්දල, යාල වැනි ප්‍රදේශ දක්වාත් මධ්‍යම කඳුකරයේ හෝර්ටන් තැන්න දක්වාත් ගමන් කර ඇත. හෝර්ටන් තැන්නේ ජීවත් වූ අවසන් අලි දෙදෙනා අඹේවෙල ගොවිපොළ ආරම්භ කල 1954 පමණ කාලයේදී අඹේවෙල ප්‍රදේශයේදීත් නුවරඑළිය නගරයට ආසන්න ප්‍රදේශයක දීත් මරා දමා ඇත. මීට අමතරව වසරේ වියළි කාලවලදී අවස්ථානුකූලව අන්තර් සහ වියළි කලාපවල සිටින අලි ඇතුන්ගෙන් සුළු කොටසක් මධ්‍යම කඳුකරයේ ඇති කඳුකර ප්‍රදේශවල ඉතා සුළු වශයෙන් ඉතිරි වී ඇති වනාන්තර ප්‍රදේශ කරා ආහාර සහ ජලය සොයා ඇදී යයි.

වර්තමානයේදී නකල්ස් කඳු පන්තිය ආශ්‍රිතව නිත්‍ය වශයෙන් ව්‍යාප්ත වී සිටින අලි ඇතුන් ගහණයක් නොමැති අතර නකල්ස් කඳු පන්තියේ පිහිටි උස් කඳුකර ප්‍රදේශවල ඇති වනාන්තර සහ තෙත් සහ වියළි පතනශීල වනාන්තර ප්‍රදේශ දක්වාද අන්තර් සහ වියළි කලාපවල ව්‍යාප්ත වී සිටින අලි ඇතුන් වසරේ ඇතැම් කාලවලදී සහ වියළි කාලයන්වලදී ගමන් කරනු ලබයි. මධ්‍යම

සහ නකල්ස් කඳු ආශ්‍රිතව ඇති බෙරගල, කුමාරතැන්න, මැටිකඳුර, බදුල්ල, මකල්දෙණිය, මාතලේ, මීමුරේ, දුම්බර, යහන්ගල, වැනි ප්‍රදේශ දක්වාද මෙම අලි ඇතුන් වියළි කාලයන්වලදී සහ වසරේ ඇතැම් කාලයන්වලදී ඔවුන්ගේ පැරණි මාර්ග ඔස්සේ ආහාර සහ ජල අවශ්‍යතාවයන් සඳහා ගමන් කරනු ලබයි.

1977 න් පසුව ඇති වූ මහවැලි වැනි අවිධිමත් කඩිනම් සංවර්ධන ව්‍යාපෘති තුළින්ද මධ්‍යම කඳුකර ප්‍රදේශයේ මහවැලි නිම්නය ආශ්‍රිත ප්‍රදේශවල ඉතිරිව සිටි අලි ඇතුන්ගේ වාසස්ථාන සහ ඔවුන්ගේ ගමන් මාර්ග අහිමි විය. මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමයට සමගාමීව ආරම්භ කරන ලද මහවැලි ජනපද ව්‍යාපාරය ඊට ප්‍රථම ආරම්භ කරන ලද වෙනත් ජනපද කරන ව්‍යාපාර, සංවර්ධන යෝජනා ක්‍රම තුළින් සහ වර්තමාන අවිධිමත් සංවර්ධන ක්‍රියාවලි තුළින් අන්තර් සහ වියළි කලාපවලට සීමා වී සිටි අලි ඇතුන් ව්‍යාප්තව පැවති එම කලාපවලට අයත් වනාන්තර තවදුරටත් විනාශ කිරීම සහ අලි මංකඩවල්වල මිනිස් වාසස්ථාන ඉදිකිරීම වැනි හේතු නිසා වියළි කලාපයේ සහ අන්තර් කලාපයේ වනාන්තරවලට පමණක් සීමා වී සිටි අලි ඇතුන් එම වනාන්තර ප්‍රමාණයද අඩු වීම නිසා තවත් ඉතා සීමිත භූමි ප්‍රදේශවලට කොටු විය. මිනිසුන් විසින් අලි ඇතුන්ගේ වාසභූමි අත්පත් කරගැනීම තුළ වර්තමානය වන විට අලි මිනිස් ගැටුමක් දක්වා එම තත්ත්වය වර්ධනය වී ඇත. වසරකට අලි ඇතුන්ගේ ජීවිත 250 කට ආසන්න ප්‍රමාණයක් සහ මිනිස් ජීවිත විශාල ප්‍රමාණයක් ද අහිමි වේ.

අලි ඇතුන්ගේ සංගණන වාර්තා

| වර්ෂය | අලි ඇතුන් ප්‍රමාණය |
|---|---|
| 19 වන සියවස | 12000 - 14000 |
| 20 වන සියවස | 10000 |
| වර්ෂ 1920 | 7000 - 8000 |
| වර්ෂ 1969 | 1745 - 2455 |
| වර්ෂ 1987 | 2500 - 3435 |
| වර්ෂ 1993 ජුනි | 1967 |
| වර්ෂ 2000 | 3150 - 4400 |
| වර්ෂ 2006 | 3150 |
| වර්ෂ 2007 | 2900 - 3000 |
| වර්ෂ 2011 | 5879 |

අවසාන වශයෙන් වනජීවී දෙපාර්තමේන්තුව විසින් 2011 වසරේ දී සිදු කරන ලද අලි සංගණනය වියළි කලාපයේ ව්‍යාප්තව සිටින අලි ඇතුන් ජලය බීමට පැමිණෙන ජල මූලාශ්‍ර පදනම්ව සිදු කරන ලද අතර එහිදී ගණනය වූ සම්පූර්ණ අලි ඇතුන් ප්‍රමාණය 5879 විය. මෙම සංඛ්‍යාව අතරින් 2% ප්‍රමාණයක් දළ ඇතුන් වූ අතර පිරිමි සතුන්ගේ ප්‍රතිශතයක් ලෙස එය 7% විය. *Elephas Maximus Maximus* ගේ පූර්වජයා ලෙස සැලකෙන *Elephas Maximus Sinhaleyus* ගේ හමුවන ෆොසිල සාධක අනුව පෙනීයන්නේ ඔවුන්ගෙන් වැඩි පිරිසක් දළ දරා ඇති බවයි. අනෙකුත් ආසියානු උප විශේෂවලට වඩා ශ්‍රී ලංකානු උප විශේෂයේ දළ පිහිටන ප්‍රතිශතය ඉතා අඩු මට්ටමක පවතී. පී.ඊ.පී. දැරණියගල මහතා විසින් 1950 දී පමණ හීලෑ අලි ඇතුන් 670 දෙනෙකු යොදාගෙන සිදු කරන ලද පර්යේෂණයක දී එම අලි ඇතුන් 670 අතරින් 6% ප්‍රමාණයක් දළ ඇතුන් බවට වාර්තා වී ඇත. මෙම කරුණ සනාථ වන තවත් කැරණක් වන්නේ ඉංග්‍රීසි පාලන කාලයේ දී මේජර් රෝජර්ස් විසින් ඝාතනය කරනලද අලි ඇතුන් 1300 දෙනෙකු අතරින් 60 දෙනෙකු දළ ඇතුන් වීමයි ප්‍රතිශතයක් ලෙස එම සංඛ්‍යාව 4% ප්‍රමාණයක් වේ. 1505 - 1948 පමණ කාලයක් දක්වා පැවති යටත් විජිත කාලයේ දී ශ්‍රී ලංකාවේ දළ ඇතුන් සඳහා ඉතා ඉහළ ඉල්ලුමක් තිබූ බැවින් දළ ඇතුන් අල්ලා වෙනත් රටවලට විකිණීම විශාල වශයෙන් සිදු වී ඇත. ඊට අමතරව ඉංග්‍රීසි පාලන කාලයේ දී දළ ලබාගැනීම සඳහා සහ විනෝදය පිණිස ඉංග්‍රීසි ජාතික දඩයම් කරුවන් විසින් දළ ඇතුන් ඝාතනය කිරීම නිසා සිදු වූ අතර ජාන හිඟ වීම ද දළ ඇතුන්ගේ ප්‍රතිශතය අඩුවීමට හේතු වූ බවට සිතිය හැකිය. වර්තමානයේ දී වියළි සහ අන්තර් කලාපවල අලි ඇතුන් ව්‍යාප්ත වී ඇති පළාත්වලින් උතුරු මැද සහ වයඹ පළාත්වල ව්‍යාප්තව ඇති අලි රංචු අතර දළ දරන පිරිමි සතුන්ගේ ප්‍රමාණයේ වැඩි ප්‍රතිශතයක් පෙන්වයි. 2008 සිට මේ දක්වා මෙම පළාත් දෙකෙහි සිදුකරනු ලැබූ නිරීක්ෂණනයන්ට අනුව පෙනී ගියේ එම රංචුවල දළ දරණ පිරිමි සතුන්ගේ ප්‍රතිශතය අනෙකුත් ප්‍රදේශවලට වඩා වැඩි අගයක් ගන්නා බවයි. මේ අනුව මෙම ප්‍රදේශවල ව්‍යාප්තවී සිටින අලි රංචුවල ඇත් ජාන බහුල වශයෙන් තිබෙන බවට සිතිය හැකිය.

## References


Deraniyagala, P.E.P. 1955. Some Extinct Elephants, Their Relatives and the Two Living Species. Ceylon National Museum Administration, Colombo.

Fernando, P., Jayewardene, J. Prasad, T., Hendavitharana, W. Pastorini, J. (2011). *Current Status of Asian Elephants in Sri Lanka*. Gajah 35: 93–103.

Kotagama, S. (1991). Sri Lanka - Enhancing the survival of elephants. Gajah: Journal of the IUCN/SSC Asian Elephant Specialist Group. Number 6: 24